
# මැනිං-ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ (1924)




## මැනිං-ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණ

- ව්‍යවස්ථාදායක මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් අඩකට වැඩි ප්‍රමාණයක් මහජන ඡන්දයෙන් තෝරා පත් කර ගත් අය වූහ. ව්‍යවස්ථාදායක සභාව පිහිටුවා දීර්ඝ කාලයක් ගත වීමෙන් පසුව වුව ද මෙම තත්ත්වය ආණ්ඩුක්‍රම වර්ධනයේ අතිශය වැදගත් සන්ධිස්ථානයක් විය.
- ආණ්ඩුව පිළිබඳ වගකීම තවදුරටත් ආණ්ඩුකාරයා වෙත පැවරී තිබිණි.
- ව්‍යවස්ථාදායක මණ්ඩලයේ බහුතරය මහජන නියෝජිතයන් වෙද්දී ආණ්ඩු කටයුතු පිළිබඳ පූර්ණ වගකීම ආණ්ඩුකාරයාට පවරා තිබීම නිසා බලය හා වගකීම බෙදී පැවතීම මෙම ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන දුර්වලතාවක් විය.
- ජනවාර්ගික නියෝජනය අත්හැර තිබුණේ නැත. එය අනාගතයේ දී අහිතකර බලපෑම් ඇති කිරීමට- එනම් සිංහල සහ දෙමළ ජන කොටස් අතර අවිශ්වාසය සහ බල තරගයක් ඇති වීමට - හේතු විය.
- විධායක සභාවට නිලනොලත් සභිකයන් තිදෙනෙකු ඇතුළත් කෙරිණි.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

**1920 මැනිං ප්‍රතිසංස්කරණයේ සහ 1924 මැනිං - ඩෙවොන්ෂර් ප්‍රතිසංස්කරණයේ සැලැසුම් දෙස බලා ජනවාර්ගික නියෝජනය සම්බන්ධයෙන් ඒවායේ ඇති කැපී පෙනෙන ලක්ෂණ ලැයිස්තු ගත කරන්න.**

## ඩොනමෝර් ආණ්ඩුක්‍රමය 1931

මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩු ක්‍රමයෙන් වුව ද ශ්‍රී ලාංකික උගත් මධ්‍යම පංතිය සතුටට පත් වූයේ නැත. බලය සහ වගකීම අතර බෙදීමක් පැවතුණ බැවින් මෙම ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී බොහෝ දුෂ්කරතා පැන නැගිණි. ඒ නිසා යළිත් වරක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු බව ආණ්ඩුකාරයා පවා පිළිගත්තේ ය. ඒ අනුව ක්‍රියාත්මක වෙමින් පැවති ආණ්ඩුක්‍රමය විමර්ශනයට ලක්කොට වඩාත් සුදුසු ආණ්ඩුක්‍රමයක් නිර්දේශ කිරීම සඳහා ක්‍රි.ව. 1927 දී ඩොනමෝර් සාමිගේ ප්‍රධානත්වයෙන් යුතු කොමිසමක් පත් කෙරිණි.

ශ්‍රී ලංකාව නිදහස කරා ගමන් කිරීමේ ගමන් මඟෙහි ඩොනමෝර් ආණ්ඩුක්‍රම සංශෝධනය සන්ධිස්ථානයක් විය. එය ක්‍රියාත්මක වූයේ ක්‍රි. ව. 1931 දී ය.

ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් මෙසේ ය.

- සර්වජන ඡන්ද බලය ලබා දීම
- පළාත්බද නියෝජන ක්‍රමය පුළුල් කිරීම
- ජනවාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම
- රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
- විධායක කාරක සභා ක්‍රමය ඇරඹීම සහ ඇමති මණ්ඩලයක් ස්ථාපිත කිරීම
- ආණ්ඩුකාරයාගේ බලතල අඩු කිරීම

මෙම යෝජනාවලින් සර්වජන ඡන්ද බලය ලබා දීම සහ රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම යන යෝජනා දෙක පිළිබඳව විස්තර ස්වල්පයක් සලකා බලමු.

## සර්වජන ඡන්ද බලය

කෲව් - මැකලම් ප්‍රතිසංස්කරණයේ පටන් ශ්‍රී ලංකාවට කිසියම් ප්‍රමාණයක ඡන්ද බලයක් ලැබී තිබිණි. එහෙත් එය ඉතා සීමිත වූවකි. උගත් ලාංකිකයන් සඳහා පමණක් එම බලය ලැබී තිබූ අතර ඔවුන් වත්කම සහ ආදායම අතින් ද කිසියම් මට්ටමක් ලබා සිටිය යුතු විය. ක්‍රි.ව. 1924 වන විටත් ඡන්ද බලය ලැබූ අයගේ සංඛ්‍යාව ජනගහනයෙන් 4% ක් පමණි.

ස්ත්‍රීන්ට ඡන්ද බලය හිමි වූයේ නැත. ඡන්ද බලය සුළු කණ්ඩායමකට පමණක් ලබා දීම අසාධාරණයක් බව ඩොනමෝර් කොමිසමේ විශ්වාසය විය. තව ද රටේ පරිපාලනය ගැන පොදු ජනතාව උනන්දුවක් නොදැක්වීමට එය හේතුවක් විය හැකි බව ද කොමිසමේ අදහස විය.

උගත් නූගත් බව, වත් පොහොසත්කම හෝ ස්ත්‍රී පුරුෂ භාවය වැනි භේද නොසලකා වයස 21 න් ඉහළ ස්ත්‍රී පුරුෂ සියලු දෙනාට ඡන්ද බලය ලබා දීමේ අවස්ථාව ඩොනමෝර් කොමිසම විසින් ලබා දෙන ලදී.

බ්‍රිතාන්‍යයේ පවා සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක කෙළේ, ඩොනමෝර් කොමිසම ශ්‍රී ලංකාව සඳහා එය යෝජනා කළ වර්ෂයේ දී එනම්, ක්‍රි.ව. 1928 දී වීම විශේෂ සිද්ධියකි.

### ශිෂ්‍ය ක්‍රියාකාරකම්

- සර්වජන ඡන්ද බලය ලැබීම ශ්‍රී ලංකාව නිදහස කරා ගිය ගමනේ දී තබන ලද දීර්ඝ පිම්මක් ලෙස සැලකීමට හේතු හතරක් නම් කරන්න.
- ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙහි දක්නට තිබූ විශේෂතම යෝජනාවක් වූ සර්වජන ඡන්ද බලය ශ්‍රී ලංකාවට ප්‍රදානය කිරීම උචිත පියවරක් විය/උචිත පියවරක් නොවී ය. මෙම තේමාව යටතේ විවාදයක් පවත්වන්න.

## රාජ්‍ය මන්ත්‍රණ සභාව

ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක කළ ක්‍රි.ව. 1931 වසර දක්වා ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක සභාව සහ විධායක සභාව යනුවෙන් වෙන් වෙන් වූ ආයතන දෙකක් පැවතිණි. එහෙයින් නීති සම්පාදනයත් නීති ක්‍රියාත්මක කිරීමත් අතර සම්බන්ධතාවක් නොවී ය. මෙම ලක්ෂණය එතෙක් පැවතුණ ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන දුර්වලකමක් ලෙස සැලකූ ඩොනමෝර් කොමිසම මෙම ආයතන දෙක විසුරුවා හැර ඒ වෙනුවට රාජ්‍ය මන්ත්‍රණ සභාව යන නමින් හැඳින්වෙන එක් ආයතනයක් යෝජනා කළේ ය.

රාජ්‍ය මන්ත්‍රණ සභාව සාමාජිකයන් - 61

| 50 | 03 | 08 |
|---|---|---|
| පළාත්බද ඡන්ද කොට්ඨාසවලින් | නිල බලයෙන් පත්වන රාජ්‍ය නිලධාරීන්<br>• රාජ්‍ය ලේකම්<br>• මුදල් ලේකම්<br>• නීති ලේකම් | ආණ්ඩුකාරයා විසින් නම් කිරීමෙන් |

රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මූලාසනය ගත්තේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් තෝරා ගත් කථානායකවරයා ය. ඔහු නොමැති අවස්ථාවල දී උප කථානායකවරයා එම තත්ත්වය දැරී ය.

## කාරක සභා

රාජ්‍ය මන්ත්‍රණ සභාවට ව්‍යවස්ථාදායක බලය මෙන් ම විධායක බලතල ද පැවරිණ. මුළු රාජ්‍ය මන්ත්‍රණ සභාව විධායක කාරක සභා 7කට බෙදනු ලැබී ය.

- ★ ස්වදේශ කටයුතු පිළිබඳ කාරක සභාව
- ★ කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ කාරක සභාව
- ★ පළාත් පාලනය පිළිබඳ කාරක සභාව
- ★ සෞඛ්‍යය පිළිබඳ කාරක සභාව
- ★ අධ්‍යාපනය පිළිබඳ කාරක සභාව
- ★ ගමනාගමනය සහ පොදු වැඩ පිළිබඳ කාරක සභාව
- ★ කම්කරු, කර්මාන්ත සහ වෙළෙඳාම පිළිබඳ කාරක සභාව

මෙම කාරක සභාවල සභාපතිත්වය දරන ලද්දේ ඡන්දයෙන් පත් වූ මන්ත්‍රීන්වරුන් විසිනි. ඇමති මණ්ඩලය සැකසුණේ මේ කාරක සභා හතේ සභාපතිවරුන් සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනාගේ එකතුවෙනි. රාජ්‍ය නිලධාරීන් තිදෙනා හැර අන් ඇමතිවරුන් යටතේ දෙපාර්මේන්තු සංවිධානය විය. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ දී රාජ්‍ය නිලධාරීන්ට ඡන්දය පාවිච්චි කිරීමට බලයක් නොවී ය.

ආණ්ඩුකාරයා සහ රාජ්‍ය නිලධාරීන් වෙත රජයේ බලතල මෙන් ම වැදගත් අමාත්‍යාංශ ද පැවරී තිබීම ගැන ශ්‍රී ලාංකික නායකයෝ විරුද්ධ වූහ. ඔවුහු ආණ්ඩුකාරයාගේ බලතල සීමා කරන ලෙසත් රාජ්‍ය නිලධාරීන් තිදෙනාට පැවරී තිබූ වැදගත් අමාත්‍යාංශ තුන දේශීය ඇමතිවරුන් වෙත පවරන ලෙසත් ඉල්ලමින් උද්ඝෝෂණ ගෙන ගියහ.

දෙවන ලෝක යුද්ධයේ අවසාන කාලය එනම් ක්‍රි.ව. 1944 දී සෝල්බරි කොමිෂන් සභාව පත් කිරීම මෙම උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් විය.

කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ ක්‍රි.ව. 1833 ආරම්භ කළ ව්‍යවස්ථාදායක සභාවට විටින් විට සිදු කෙරුණු සංශෝධන සංක්ෂේපයෙන් පහත සටහනින් දැක්වේ.

| වර්ෂය | ආණ්ඩුක්‍රමය හඳුන්වන නාමය | ව්‍යවස්ථාදායක මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව | නිලලත් මන්ත්‍රීන් සංඛ්‍යාව | ඡන්දයෙන් පත් වූ සංඛ්‍යාව | ආණ්ඩුකාරයා විසින් පත් කරන ලද සංඛ්‍යාව | නිලනොලත් මන්ත්‍රීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1833 | කෝල්බෲක් | 15 | 09 | 00 | 06 | 06 |
| 1910 | කෲව්-මැකලම් | 21 | 11 | 04 | 06 | 10 |
| 1920 | මැනිං | 37 | 14 | 16 | 07 | 23 |
| 1924 | මැනිංඩෙවොන්ෂයර් | 49 | 12 | 29 | 08 | 37 |
| 1931 | ඩොනමෝර් | 61 | 03 | 50 | 08 | - |
| 1947 | සෝල්බරි | 101 | - | 95 | 06 | - |

## සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ - 1947

ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය ක්‍රි.ව. 1931 - 1947 දක්වා ක්‍රියාත්මක වූ නමුත් ලාංකිකයන්ගේ බලාපොරොත්තු ඉටු කිරීමට සමත් වූයේ නැත. ඔවුහු දිගින් දිගට ම පූර්ණ වගකිව යුතු ආණ්ඩුක්‍රමයක් හෙවත් ඩොමීනියන් තත්ත්වයක් ඉල්ලා උද්ඝෝෂණ කළහ.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රි.ව. 1944 දී දිවයිනට එවන ලද සෝල්බරි කොමිෂන් සභාව මඟින් නව ආණ්ඩුක්‍රමයක් යෝජනා කරනු ලැබී ය.

## සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

- ★ ආණ්ඩුකාර ධුරය අහෝසි කොට අග්‍රාණ්ඩුකාර ධුරයක් ස්ථාපනය කෙරිණි. එංගලන්තයේ කිරීටය නියෝජනය කළ ඔහු නාමමාත්‍රික විධායකය විය.
- ★ ද්වි මණ්ඩල පාර්ලිමේන්තුවක් පිහිටු විය. එය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයකින් සහ උත්තර මන්ත්‍රී මණ්ඩලයකින් සමන්විත විය. උත්තර මන්ත්‍රී මණ්ඩලය සෙනෙට් සභාව ලෙස හැඳින්විණි.
- ★ අගමැතිගේ ප්‍රධානත්වයෙන් කැබිනට් මණ්ඩලයක් පත් කෙරිණි.
- ★ රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම පිහිටු විය.

ඒ අනුව සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ ශ්‍රී ලංකාවට පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ලැබිණි. මෙම ආණ්ඩුක්‍රමය යටතේ විධායක කටයුතු පැවරුණේ අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලයට යි. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීන් අතුරින් බහුතර සංඛ්‍යාවගේ සහයෝගය ලබා ගත් තැනැත්තා අග්‍රාණ්ඩුකාරයා විසින් අගමැති ධුරයට පත් කරන ලදී.

- ★ කැබිනට් මණ්ඩලය තෝරා ගැනුණේ අගමැතිවරයාගේ අභිමතය පරිදි ය.
- ★ එහි සාමාජිකයන් දෙදෙනකුට වැඩි සංඛ්‍යාවක් සෙනෙට් සභාවෙන් තෝරා ගත යුතු වූ අතර අධිකරණ අමාත්‍යාංශය අනිවාර්යයෙන් ම සෙනෙට් සභිකයකුට පැවරිය යුතු විය.
- ★ සෙසු ඇමතිවරුන් මහජන නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් තෝරා ගත යුතු වූ අතර ආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමති ධුර අනිවාර්යයෙන් ම අගමැතිවරයා විසින් දැරිය යුතු විය.
- ★ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ක්‍රි.ව. 1947 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ මහ මැතිවරණයක් පැවැත්විණි. එහිදී වැඩි ආසන සංඛ්‍යාවක් දිනාගත් පක්ෂයේ නායකයා වූ ඩී.එස් සේනානායක මහතා ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති ධූරයට පත් විය. පළමුවන අග්‍රාණ්ඩුකාර ධූරයට පත් වුයේ සර් මන්ක් මේෂන් මුවර්ය.

සෝල්බරි ආණ්ඩුක්‍රමය ප්‍රකාශයට පත් කළ ක්‍රි.ව. 1947 ලංකා රාජඥාව (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව) අනුව බ්‍රිතාන්‍ය රැජින ලංකාවේ නායිකාව වශයෙන් පිළිගත යුතු විය. අග්‍රාණ්ඩුකාරයා පත් කරනු ලබන්නේ රැජින විසිනි. රැජින වෙනුවෙන් අග්‍රාණ්ඩුකාරයා විසින් ඉටුකළ යුතු වූ විධායක කටයුතු මෙහෙයවීම, ඇමති මණ්ඩලය වෙත පැවරිණි.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සාමාජිකයන් 101 දෙනෙකුගෙන් සමන්විත විය.

එයින් 95 දෙනෙක් සර්වජන ඡන්ද බලයෙන් තෝරාගනු ලැබී ය. නියෝජනය නොවූ සුළු ජාතීන් වෙනුවෙන් 06 දෙනකු පත් කෙරිණි. පාර්ලිමේන්තුවේ නිලකාලය වසර පහකි. උත්තර මන්ත්‍රී මණ්ඩලය සාමාජිකයන් 30 දෙනෙකුගෙන් සමන්විත විය. ඔවුන් අතුරින් 15 දෙනෙකු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ඡන්දයෙන් ද ඉතිරි 15 දෙනා අගමැතිගේ උපදෙස් පරිදි අග්‍රාණ්ඩුකාරයා විසින් ද පත් කරන ලදී.

ඇමති මණ්ඩලයේ ප්‍රධානියා අගමැතිවරයා විය. ඇමති මණ්ඩලය පත් කරන්නේ අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසින් මන්ත්‍රීන්වරුන් අතුරින් ය. රටේ ආණ්ඩුව මෙහෙයවනු ලබන්නේ අමාත්‍ය මණ්ඩලය විසිනි. අග්‍රවිනිශ්චයකාරවරයා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කරන්නේ ද අග්‍රාණ්ඩුකාරයා විසින් ය. අග්‍රවිනිශ්චයකරුගේ ප්‍රධානත්වයෙන් යුත් අධිකරණ සේවා කොමිසමක් විය. මේ කොමිසම අධිකරණයට සම්බන්ධ විනිශ්චයකරුවන්ගේ පාලන කටයුතු මෙහෙය විය.

එසේ ම රාජ්‍ය සේවා කොමිසමක් ද පත් කෙරිණි. රාජ්‍ය නිලධාරින්ගේ පත් කිරීම්, උසස් කිරීම්, සේවයෙන් ඉවත් කිරීම් යනාදියට අදාළ පරිපාලන කටයුතු ඒ මඟින් ඉටු කෙරිණි.

දිවයිනේ මූල්‍ය කටයුතු සම්බන්ධ ව අරමුදලක් ඒකාබද්ධ අරමුදල නමින් ස්ථාපිත විය.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

පහත සටහන් මාතෘකා යටතේ කෙටි සටහන් ලියන්න.
අග්‍රාණ්ඩුකාරයා, උත්තර මන්ත්‍රී මණ්ඩලය, රජයේ ඒකාබද්ධ අරමුදල සහ කැබිනට් මණ්ඩලය.

## පරිපාලන ක්‍රමය

### ක්‍රි. ව. 1796 - 1833 දක්වා

බ්‍රිතාන්‍යයන් මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කොට ගත් අවස්ථාවේ සිට ක්‍රි.ව. 1948 නිදහස ලැබෙන තෙක් ශ්‍රී ලංකාවේ සිදු වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ගැන අපි සාකච්ඡා කෙළෙමු. එම යුගයේ පැවති පරිපාලන ක්‍රමය ගැන ද යමක් ඉගෙනීම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පරිපාලනය සම්බන්ධ කටයුතු ඇරඹෙන්නේ ක්‍රි.ව.1796 දී පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීමත් සමඟ ය.

ඉන්දියාවේ බ්‍රිතාන්‍යයන් යටතේ පැවති ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලද පරිපාලන ක්‍රමය ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ද ක්‍රියාත්මක කරන ලදී. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව එකිනෙකට සමීපව පිහිටි රටවල් වුවත් ඒ දෙක අතර බෙහෙවින් වෙනස්කම් ඇති බව නොදන සිටි ඉංග්‍රීසීන් විසින් ඉන්දියාවේ නිලධාරින් එවා ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ද පාලනය කිරීම ආරම්භ කෙරිණි. ඉතා මෑතක් වන තෙක් ම ක්‍රියාත්මක වූ කච්චේරිය මේ යුගයේ පරිපාලන මධ්‍යස්ථානය විය.

ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ යටත් විජිතයක් බවට පත්වීමත් සමග එම ප්‍රදේශවලට ද වෙනත් යටත් විජිත පාලනය වූ ආකාරයට සැකසුණු පරිපාලන ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. ඒ සමග ම ආණ්ඩුකාරයා ප්‍රධාන වූ සිවිල් සේවා ක්‍රමය ද ක්‍රියාත්මක කරනු ලැබී ය.

ආණ්ඩු මධ්‍යයේ ඉහළින් ම ආණ්ඩුකාරයා ද ඔහු යටතේ ප්‍රධාන ලේකම් ද විය. ඔහුගේ ප්‍රධානත්වයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීහු ද ප්‍රාදේශීය පාලන කටයුතු භාර වූ ''කලෙක්ටර්වරු'' ද ක්‍රියාත්මක වූහ. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ප්‍රදේශ සඳහා වෙන ම සිවිල් සේවයක් ආරම්භ කළ අතර එංගලන්තයෙන් පත් කර එවන ලද "රයිටර්ස්" නමින් හැඳින් වූ ආධුනික සිවිල් සේවකයන් සුදුසු තනතුරුවලට පත් කිරීම ද, ඔවුන්ට උසස් වීම් ලබා දීම ද, විනය භාරව කටයුතු කිරීම ද ආණ්ඩුකාරයාට පැවරී තිබූ අතර සියලු පරිපාලන කටයුතු පිළිබඳ වගකීම ද ආණ්ඩුකාරයාට පැවරී තිබිණි.

උඩරට ගිවිසුම පරිදි ක්‍රියාත්මක කරන ලද දේශීය පාලන ක්‍රමය වෙනස් කෙළේ ක්‍රි.ව. 1817 -1818 නිදහස් සටනින් ස්වදේශිකයන් පරාජය වූ අවස්ථාවේ ය. එහිදී සිංහල නායකයන්ගේ බලතල ඉවත් කොට ඒ අවධියේ මුහුදු බඩ ප්‍රදේශවල ක්‍රියාත්මක වෙමින් පැවති ඉංග්‍රීසි සිවිල් සේවා පරිපාලන ක්‍රමය උඩරට ප්‍රදේශවලට ද හඳුන්වා දෙන ලදී.

උඩරට නිදහස් සටන මර්දනය කරනු ලැබීමෙන් පසුව ක්‍රි.ව. 1818 නොවැම්බර් මස 21 වන දින වගන්ති 56 කින් යුත් ප්‍රකාශයක් ඉංග්‍රීසි ආණ්ඩුව විසින් නිකුත් කරන ලදී. මෙය ක්‍රි.ව. 1818 උඩරට ප්‍රකාශනය ලෙස හැඳින්වේ. එය ගිවිසුමක් නොව බ්‍රිතාන්‍යයන් විසින් ඒකපාර්ශික ව ඉදිරිපත් කළ ආඥාවක් විය. ක්‍රි.ව. 1818 - 1833 තෙක් උඩරට පාලනය කරන ලද්දේ එහි සඳහන් පාලන ක්‍රමය අනුව ය.


ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් මෙන් ම පරිපාලන ක්‍රමයේ ද ප්‍රථම තීරණාත්මක සංශෝධනය ඇති වන්නේ ක්‍රි.ව. 1833 දී ය.

## ක්‍රි.ව. 1833 හඳුන්වාදෙන ලද ප්‍රතිසංස්කරණ යටතේ පරිපාලනමය වෙනස්කම්

- උඩරට සහ මුහුදුබඩ ප්‍රදේශ වශයෙන් එතෙක් වෙන් වෙන් ව පැවති පරිපාලන ඒකක දෙක ක්‍රි.ව. 1833 ප්‍රතිසංස්කරණ යටතේ ඒකාබද්ධ කෙරිණි.
- උඩරට හා මුහුදුබඩ ප්‍රදේශ ඒකීය පාලන ක්‍රමයක් යටතේ පාලනය කිරීමට විධිවිධාන යොදනු ලැබී ය.
- සිවිල් සේවය සංශෝධනය කරනු ලැබී ය. ඒ අනුව වියදම අඩු කොට ගැනීම සඳහා විශ්‍රාම වැටුප අහෝසි කෙරිණි. ඊට හිලව් වශයෙන් සිවිල් සේවකයන්ට පුද්ගලික ව්‍යාපාරවල යෙදීමට අවස්ථාව ලබා දුනි. එතෙක් ඉතා විනයගරුක ව පැවති සිවිල් සේවයේ පිරිහීමක් ක්‍රි.ව. 1833 ප්‍රතිසංස්කරණවලින් පසුව දක්නට ලැබිණි.
- වියදම් කපා හැරීම සඳහා පළාත් ගණන අඩුකොට මුළු රට ම පළාත් පහකට බෙදන ලදි. එම පළාතක් භාරව ඒජන්තවරයකු සහ උප ඒජන්තවරයකු බැගින් පත් කරන ලදී.

- රජයේ පහළ ශ්‍රේණි සඳහා දේශීය පුද්ගලයන් පුරුදු පුහුණු කිරීමේ බලාපොරොත්තුවෙන් අධ්‍යාපන කටයුතු ප්‍රතිසංවිධාන කොට රජය මගින් පවත්වා ගැනීමට විධිවිධාන යොදනු ලැබී ය.
- ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීමට පියවර ගැනිණි.
- අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කරනු ලැබී ය.


පළාත් ගණන පහ දක්වා අඩුකිරීමෙන් සිවිල් සේවකයන්ට පැවැරුණ වගකීම් ප්‍රමාණය ද ඉටුකළ නොහැකි තරම් වැඩි විය.




1.1 සිතියම
කෝල්බෲක් කොමිසමේ නිර්දේශය පරිදි ඇති කළ පළාත් පහ
දැක්වෙන සිතියම

ප්‍රාදේශීය පරිපාලන කටයුතු ශක්තිමත් කිරීම සඳහා විටින් විට නව පළාත් පිහිටුවමින් ක්‍රි. ව. 1900 වනවිට පළාත් සංඛ්‍යාව 9 දක්වා ඉහළ නැංවී ය. ඒ අනුව ක්‍රි.ව. 1848 දී වයඹ පළාත ද, ක්‍රි.ව. 1873 උතුරු මැද පළාත ද, ක්‍රි.ව. 1886 දී ඌව පළාත ද, ක්‍රි.ව. 1889 සබරගමු පළාත ද පිහිටුවන ලදී. (පළාත් 9 දැක්වෙන සිතියම බලන්න.)

ශීඝ්‍රයෙන් වර්ධනය වූ වතුවගාව ද ඒ හා සම්බන්ධිත විවිධ ව්‍යාපාර ද හේතුකොට ගෙන රටේ නගර බිහිවෙන්නට පටන් ගැනිණි. එම නාගරික ප්‍රදේශවල ජනගහනය අධික වීමෙන් ඔවුන්ගේ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීමට විශේෂ පරිපාලන ව්‍යුහයක් අවශ්‍ය විය. මහ නගර සභා පිහිටුවීම එහි ප්‍රතිඵලයක් විය.




1.2 සිතියම
ශ්‍රී ලංකාව පළාත් නවය දක්වා වැඩි වීම

## මහ නගර සභා

ක්‍රි.ව. 1865 දී කොළඹ නගරයේ ද ක්‍රි.ව. 1866 දී මහනුවර සහ ගාල්ල යන නගරවල ද මහ නගර සභා පිහිටුවන ලදී. මේවායෙහි නිලධාරීහු මෙන් ම මහජන නියෝජිතයෝ ද කටයුතු කළහ. සමහර නගරවල පළාත් පාලන මණ්ඩල ද පිහිටු විය. මේවායෙහි සාමාජිකයන්ගෙන් වැඩි දෙනා මහජනයා විසින් පත් කළ අය වූහ. එබැවින් මෙම පළාත් පාලන ආයතනවල ඡන්දය පාවිච්චි කිරීමෙන් පරිපාලනයට සහභාගි වීමේ පෙර හුරුවක් ලබා ගැනීමට ජනතාවට අවස්ථාවක් ලැබිණි.

පසු කාලයේ දී මධ්‍යම ආණ්ඩුවේ පරිපාලනයට සහභාගි වූ අය අතර මේ පළාත් පාලන ආයතනවල අත්දැකීම් ලැබූ අය බහුල වීම එම ආයතනවලින් ශ්‍රී ලාංකිකයන් පෙර හුරුවක් ලැබූ බවට සාක්ෂි වේ.

## ගම් සභා

ශ්‍රී ලංකාවේ ඈත අතීතයේ පටන් ම මහජන අවශ්‍යතා සම්පූර්ණ කළ ගම් පාලන ක්‍රමයක් පැවතිණි. ඒ ආයතන ගම් සභා යනුවෙන් හැඳින්විණි.

ගම් සභා ක්‍රමය නැවත පණ ගැන්වීම සඳහා ක්‍රි.ව. 1856 දී ගම් සභා පනතක මුහුණුවර ගත් වාරිමාර්ග පනතක් පැනවී ය. එම ගම් සභාවල සභාපති ලෙස කටයුතු කළේ අදාළ ප්‍රදේශයේ ඒජන්තවරයා ය.

ක්‍රි.ව. 1871 දී පැරණි ගම් සභා ක්‍රමය පූර්ණ වශයෙන් නැවත ප්‍රතිෂ්ඨාපනය කෙරිණි. එම ගම් සභාව මහජන නියෝජිතයන්ගෙන් සමන්විත විය. සභාපති තනතුර ඒජන්ත තැන විසින් දරන ලදී. සම්මත නීති රීති කඩ කළ අයට දඬුවම් දීමට ද ගම් සභාවලට බලය ලැබිණි.

ක්‍රි.ව. 1924 දී පැනවූ ආඥාවක් මගින් ගම් සභාපතිවරුන් ලෙස මහජන නියෝජිතයන් පත් කොට ගැනීමට අවස්ථාව ලැබිණි. ක්‍රි.ව.1933 සහ ක්‍රි.ව. 1938 දී එවක පළාත් පාලන ඇමතිවරයා වූ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා විසින් ගම් සභාවල බලතල පුළුල් කොට ඒවා ශක්තිමත් කරන ලදී.

ක්‍රි.ව. 1948 නිදහස ලැබෙන තෙක් ම මධ්‍යම ආණ්ඩුවේ පරිපාලන ව්‍යුහය ද පළාත් පාලන ආයතන පද්ධතිය ද එතරම් වෙනසක් නැතිව ක්‍රියාත්මක විය.